## සිය ජීවිතය තුළින් අනෙකාගේ යහපත පැතූ අනගාරික ධර්මපාල චරිතය දෙස වසර 152කට පසුව නැවත හැරී බලමු

**එන්.එම්. අමිල නුවන් මධුසංඛ**
සහකාර කථිකාචාර්ය
කැලණිය විශ්වවිද්‍යාලය
*nuwanamila7777@gmail.com*

දිනූ මව්බිමට නිවහල් ලෙස වැජඹෙන්න
තම ජාතියට අභිමන් ලෙස නැගිටින්න
ඉපදුන රටට නොමියෙන ලෙස මිය යන්න
ඔබ කළ මෙහෙය ඇති හැම සිත් පුබුදන්න

ගලා හැලෙන ඇළ දොළ, ගංගා මිහිරි ගී ගයමින් සයුරු කරා ඇදී යන්නේත්, ගහ කොළ මත නැළැවෙන පුෂ්පයෝ නැවුම් සුවඳ සුළඟට මුහු කරන්නේත්, සියොත් කැල සිය ඉමිහිරි නද වෙනදා නොමැති ස්වරයකින් අවකාශයට මුදාලන්නේත් එක් සුවිශේෂී කරුණක් නිසා යැයි කිසිවෙකුත් නොසිතන්නට ඇත. නමුත් සොබාදහම පවා සතුටින් ඔදවැඩී සිය ජෛවී ක්‍රියාවලීන් වෙත නව ජීවයක් ලබා දුන්නේ සැබැවින්ම එක් සුවිශේෂී කාරණාවක් නිසාවෙනි. සොබාදහම එවන් පෙළහරක් පෑවේ සිංහල ජාතියට, සිංහල දේශයට ආදරය කළ, අපේකම, අපේ උරුමය සියතින් ගත් මානව දයාව පිරි හදවතක් ලංකා මාතාවගේ මව් කුසයෙන් බිහිවූ බව සකල ලෝක සත්වයාට ඒත්තු ගැන්වීම පිණිසයි. ඒ සුවිශේෂී දිනය උදාවූයේ අදින් වසර 152 කට පෙරය. පසු කලෙක ජාතියේ සැබෑ පියාණන් වූ පින්වත් කුමරු, එසේත් නැතිනම් දොන් ඩේවිඩ් හේවාවිතාරණයන්ගේ උපත සිදුවන්නේ ඒ අයුරිනි.

වර්ෂ 1864 සැප්තැම්බර් 17 වන දින දොන් කරෝලිස් හේවාවිතාරණයන් ට සහ දොන් මල්ලිකා හේවාවිතාරණයන් ට දාව කොළඹදී ජන්ම ලාභය ලබන දොන් ඩේවිඩ් හේවාවිතාරණයන් පසු කලෙක ජාතියක් පුබුදුවාලීමට උරදුන්, නිද්‍රාශීලී ජන සමූහයක් අවදිකරවීමට කැපවූ ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමන් ලෙස වත්මන් ජාතිය ඉදිරියේ ගරු බුහුමනට පාත්‍රව සිටී. ඒ අන් කිසිවක් නිසා නොව ඔහු තුළ වූ ජාතික හා ආගමික ආලය නිසාවෙන්ම ය.

දොන් ඩේවිඩ් උපන්නේ වර්තමානයට වඩා බෙහෙවින් වෙනස් වූ යුගයක ය. ඔහු උපන්නේ විදේශීය ආධිපත්‍යයෙන් ජාතිය, ආගම සහ සංස්කෘතිය යන සෑම අංශයක්ම බියගුළු වී තිබූ සමයක, භික්ෂූන් වහන්සේලා මහජනතාවගෙන් ඈත් කරන්නට කටයුතු කළ අවධියක,

සාමාන්‍ය ජනතාව අන්ත අසරණ තත්ත්වයට පත්ව සිටි සමයක යි. කුඩා කල සිටම අධ්‍යාපනයට දැක්වූ කැමැත්ත සහ දක්ෂතාවය හේතුකොට ගනිමින් සහ මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමිපානන්ගේ දේශනයන්ට සවන් දෙමින් කිතු දහමේ සහ බුදු දහමේ ගැබ්වූ වෙනස මැනවින් අවබෝධ කර ගත්තේය. සිය විවේක කාලය පුස්තකාලයන් හි ගත කරන්නට කටයුතු කළ මොහු සාමාන්‍ය තරුණයකුට වඩා වෙනස් වූයේ අන් අය නොකරන අන්දමේ යහපත් ක්‍රියා කරමින් සහ අන් අය නොයන මාර්ගයේ යමින් කාලය ගෙවූ එඩිතර තරුණ ගැටයකු වූ නිසාය.

ඉංග්‍රීසි භාෂාව ලිවීමට හා කියැවීමට දක්ෂකම් දැක්වූ හේවාවිතාරණ රැකියාව වශයෙන් මුලින්ම තෝරාගන්නේ රජයේ ලිපිකරු වෘත්තියකි. පසුව සම්බුද්ධ ශාසනයේ උන්නතිය වෙනුවෙන් කැපවීමේ අවශ්‍යතාවයෙන් පෙලුණු මොහු සිය රැකියාවෙන් පවා ඉවත් වී ධර්මපාල යන නම ආරූඪ කරගන්නා ලදි. වර්ෂ 1880 මැයි 17 වන දිනය ඔහුගේ ජීවිතයේ අති සුවිශේෂී දිනයක් ම වන්නේය. ඒ ඔහුගේ ගමනට විශාල ශක්තියක් වූ හෙන්රි ස්ටීල් ඕල්කට්තුමා සහ බ්ලැවැට්ස්කි මැතිනියගේ හමුවීම සිදුවූ නිසාවෙනි. ඕල්කට්තුමා බෞද්ධාගමික ප්‍රබෝධය වෙනුවෙන් රට පුරා යමින් නොයෙක් දේශනා පවත්වන විට එම දේශනාවන් ඉංග්‍රිසියෙන් සිංහලයට පරිවර්තනය කරනු ලැබුවේ ඩේවිඩ් නම් වූ මේ තරුණයා යි. දිනක මෙම තරුණයා සිය මාපියන් වෙත ලියුමක් ලියා තබා තරුණ වියේ සිට සියලු දෙනාගේ සුබ විහරණය වෙනුවෙන් කැප වන්නට තීරණය කළේය. ඔහු ලියා තිබුණේ මෙවැනි ලිපියකි.

දයාබර පියාණන් සහ මෑණියන් වෙතටයි,
එක් පුද්ගලයකුගේ නොව සියලු ලෝක සත්වයාගේ සැප ප්‍රාර්ථනා කරන මට ඔවුන්ගේ දියුණුවට වැඩ කිරීමට ඉඩ දෙනු මැනවි. මා හට ලෞකික සැපයක් අවශ්‍ය නැත. මා විසින් දොහොත් මුදුන් දී ඉල්ලන ඉල්ලීමට බාධා නොපමුණුවා චිත්ත ප්‍රීතියෙන් ඒ සඳහා මට අවසර ලබාදෙන ලෙස මා ඉල්ලා සිටිමි. ඒ මෙයයි. සම්පූර්ණයෙන්ම මාගේ කාලය බුද්ධාගමේ දියුණුව පිණිස වැඩ කරන්නට මට අවශ්‍යව ඇත. එනිසා මාගේ ජීවිකාව ආරක්ෂා කරගැනීමට මසකට රුපියල් පහක් ලබා දෙන ලෙස ඉල්ලමි. මේ ඉල්ලීම ඉටු කළහොත් අප සියල්ලන්ගේම නිවන් මාර්ගය ලේසි වේවි. එම නිසා බාධා නොපමුණුවා එම ඉල්ලීම ඉටු කරනු මැනවි. සාරා සංඛෙයිය කල්ප ලක්ෂයක් අප බෝධිසත්වයන් වහන්සේ ලෝක සත්ත්වයා නිසා දුක් වින්දා නම් හැකි තාක් ලෝක සත්වයාගේ දියුණුව වෙනුවෙන් කටයුතු කරන්නට අපට නොහැකිද ?

මීට යටහත් පුත්‍ර, ඩේවිඩ්

හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමිගේ කරුණු පහදා දීමෙන් අනතුරුව ඩේවිඩ්ගේ පියා ඔහුට අනගාරික වීමට අවසර ලබාදුන්නේය. අනතුරුව ඔහු දොන් ඩේවිඩ් යන විදේශික නාමය අතහැර දමා ධර්මපාල හේවාවිතාරණ යන සිංහල නාමය භාවිත කරන්නට පටන් ගත්තේය.

ඔහු ගත කළ බ්‍රහ්මචාරී ජීවිතය නිසා අනගාරික යන නම ධර්මපාල නමට මුලින් යොදන්නට කටයුතු කරන ලදී. වර්ෂ 1886 සිට 1890 දක්වා කාලය තුළ බෞද්ධ පරම විඥානාර්ථ සංගමයේ බෞද්ධ අංශයේ මහ ලේකම් ධූරයත්, බෞද්ධ මුද්‍රණාලයේ හා සරසවි සඳරැස පත්‍රයේ කළමණාකරු ධූරයත්, බෞද්ධ පාසැල් කළමණාකරු ධූරයත්, බෞද්ධ ආරක්ෂක කමිටුවේ සහායක ලේකම් යනාදී තනතුරු ධර්මපාලතුමා විසින් දරන ලදී. 1890 වනවිට අනගාරික ධර්මපාලතුමාගේ වයස අවුරුදු 26 ක් විය. ඉන්දීය සංචාරයකදී බුද්ධගයාව හින්දුන්ට අයත්ව තිබෙනු දැක මහත් සංවේගයට පත් අනගාරික ධර්මපාලතුමන් යළිත් ලංකාවට පැමිණ බුද්ධගයාව බේරාගැනීමේ මෙහෙයුම ආරම්භ කරන ලදී. එහිදී එතුමන් භාවිත කළ ඉතා ප්‍රසිද්ධ සටන් පාඨ කිහිපයක්ම විය. ඒ අතර,

- සිංහලයිනි නැගිටිව්.. බුද්ධගයාව බේරාගනිව් ... (1890 දඹදිව බුද්ධගයාව වන්දනාවේ දී පවසන ලද්දකි)
- හරක් මස් නොකනු... රා නොබොනු... (එතුමාගේ ප්‍රචාරක රථයේ සඳහන් කළ අමද්‍යප සටන් පාඨය)

මූලික තැනක් ගනු ලැබීය. බුරුම පන්සලක නැවතී බුද්ධගයාව බේරාගැනීමේ අරමුනෙන් මෙරට භික්ෂූන් වහන්සේලා එහි ගෙන්වාගනිමින් නොයෙක් කටයුතු සංවිධානය කරන ලදි. නමුත් ඒ වනවිට බුද්ධගයාව අත්කර ගෙන සිටි පිරිස අනගාරික ධර්මපාලතුමා ඇතුළු පිරිසට විශාල වශයෙන් බාධා පමුණුවන්නට විය. කෙසේ නමුත් බුද්ධගයාව වෙනුවෙන් ධර්මපාලතුමන් දරන මහන්සිය හා කැපවීම දුටු ඉන්දීය ජාතික ව්‍යාපාරයේ පිරිස් සිය පටු අරමුණු පසෙකට කරගැනීමට ක්‍රියා කළහ.

ක්‍රිස්තියානි මිෂනාරි බලපෑමෙන් ජපන් බුදු සමය ආරක්ෂා කරගැනීමේ අරමුණ ඇතිව ඕල්කට්තුමා ට ජපානයෙන් ලැබුණු ආරාධනයට අනුව ඔහු 1889 ජනවාරි 10 වන දින ධර්මපාලතුමන් සමඟ ජපානය බලා පිටත්ව ගියහ. ලංකාවෙන් ජපානයට ගිය පළමු ධර්මදූතයා වශයෙන් ද අනගාරික ධර්මපාලතුමන් ඉතිහාසයට එකතු වේ. එහිදී පැවැත්වූ බෞද්ධ සම්මේලනයක දී ප්‍රථමවරට බෞද්ධ කොඩිය විදෙස් රටක දී ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන ලදී.

වර්ෂ 1921 දී ධර්මරාජිකා විහාරයත්, 1931 දී මූලගන්ධකුටි විහාරයත් ඉන්දියාවේ ස්ථාපනය කිරීමට අනගාරික ධර්මපාලතුමාට හැකිවිය. ධර්මපාලතුමාගේ උත්සාහය නිසා බුදුන් වහන්සේගේ පරිනිර්වාණ භූමිය නැවතත් බෞද්ධයන්ගේ සිද්ධස්ථානයක් බවට පත්කර ගැනීමට හැකියාව ලැබුණි. ශ්‍රී ලංකාව නිදහස් නිවහල් දේශයක් කිරීම උදෙසා මෙරට දේශීය කර්මාන්ත නගා සිටුවිය යුතු බව අවබෝධ කරගත් ධර්මපාලතුමා මෙරට තරුණයින්ට වාර්ෂිකව ජපානයට ගොස් කර්මාන්ත ඉගෙනගැනීමට ශිෂ්‍යත්ව ලබාදීමට පවා කටයුතු

කරන ලදී. එතුමන්ගේ සහාය වීමෙන් පේෂ කර්මාන්තය ඉගෙනගත් යූ. බී. දොලපිහිල්ල, පිඟන් කර්මාන්තය හා චිත්‍ර ශිල්පය හැදෑරූ ඩී. සී. හින්නි අප්පුහාමි, සුවඳ විලවුන් කර්මාන්තය හැදෑරූ ජෝන් එෆ් කුරේ, කඩදාසි කර්මාන්තය හැදෑරූ එන්. ජේ. සෝමරත්න, ගිනිකූරු කර්මාන්තය හැදෑරූ බාලසූරිය සහ ගොවි කර්මාන්තය හැදෑරූ මුණසිංහ එසේ කර්මාන්ත පිළිබඳව හදාරා මෙරටට පැමිණි කැපී පෙනෙන ශිෂ්‍යයෝ වූහ. කෙසේ නමුත් බ්‍රිතාන්‍ය පාලකයින් විසින් අනගාරික ධර්මපාලතුමා 1914 කල්කටාවේ දී නිවාස අඩස්සියට පත් පත් කළහ. ඔහු ඉන් නිදහස ලැබුවේ 1921 දීය. ඒ අනුව වසර හතක කාලයක් එතුමන්ට නිවාස අඩස්සියේ සිටීමට සිදුවිය.

සිය ජීවිත කාලය තුළ රට, ජාතිය, ආගම රැකගැනීම වෙනුවෙන් අප්‍රතිහත මෙහෙවරක් ඉටුකළ ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමන් විටෙක කරුණාබර හදවතින් සිංහලයින් ට කරුණු පැහැදිළි කර දුන්නාක් මෙන්ම තවත් විටෙක දැඩි ආවේගයකින් සහ කෝපයකින් සිංහලයින් අවදි කරනු වස් කෑමොර දෙන්නට විය. ඒ ඔවුන් කෙරෙහි වූ අපරිමිත දයානුකම්පාව නිසාවෙන් මිස අනෙකක් නිසා නොවේ. එතුමන්ගේ දීර කාහල නාදය වර්තමානයේ ද මිහිතලය සිසාරා රැව් පිළිරැව් දෙන්නේ අනගාරික නාමයේ පවතින වටිනාකම සියල්ලන්ටම අවබෝධ කරලමිනි. සිංහල බෞද්ධ උරුමය හා අයිතිවාසිකම් රැක ගැනීමට පෙරමුණ ගැනීම නිසා ජනතාව සංවිධානය කොට ඔවුන්ට කරුණු අවබෝධ කරලීමට එතුමා ගම් දනව් පුරා සැරි සැරුවේය. එවැනි ගමන් බිමන්වල පහසුව සඳහා එතුමන් "ශෝභන මාලිගාව" නමින් හැඳින්වුනු රථයක් භාවිත කළ අතර එහි නැගී රටේ නොයෙක් ප්‍රදේශයන්හි ගමන් කරමින් නිද්‍රාශීලී පරගැති අදහස් දැරූ සිංහලයින් දේශීය චාරිත්‍රයන්ට අනුව හැඩගස්වන්නට ප්‍රබල වෙහෙසක් දැරීය. එම ශෝබන මාලිගය දැනටත් කොළඹ මාලිගාකන්ද මහා බෝධි විහාර පරිශ්‍රයේ කෞතුක වස්තුවක් ලෙස සංරක්ෂණය කර තිබෙන අයුරු දැකගත හැකිය.

"මතක තියාගනිල්ලා කවදාහරි සුද්දෝ මේ රට දාලා යනවා. උන් යන්නෙ උන්ගෙ දරුවො වගේ කළු සුද්දො විසි තිස් දාහක් බෝ කළාට පස්සෙයි. ඊට පස්සෙ අපේ රට පාලනය කරන්නෙ කළු සුද්දො. උන් සිංහල භාෂාවට සහ සිරිත් විරිත් වලට වෛර කරනවා. උන් ඉංග්‍රීසියම රජ කරවාවි. පන්සල් වටේ පල්ලි, කෝවිල් ඉදිකරාවි.

උඹලා උඹලා වෙනුවෙන් දියසේන කුමාරයෙක් ඉපදෙනකන් බලාගෙන ඉන්නවා. උපදින්න ඉන්න දියසේනලා තිඹිරිගේ ඇතුළේදිම මරල දාන්න කළු සුද්දන්ට පුළුවන් කියන එක අමතක කරන්න එපා. අපේ හාමුදුරුවන්ට උන් එදාට ඉනා බේත් දෙනවා. ඒ දවස එනකොටත් උඹලෑ කෙල්ලො කොල්ලන්ට ඇටි කෙහෙල් කාපු රිලව් වගේ නියෝ නියෝ තමයි ඉන්න වෙන්නේ. "

-අනගාරික ධර්මපාලතුමා 1926 දී කරන ලද ප්‍රකාශයකි-

මෙවැනි වදන් අනගාරික ධර්මපාලතුමාගේ මුවින් නිරන්තරයෙන් පිටවූයේ ජාතියට හා ආගමට ඇති ආදරය, කැක්කුම නිසාවෙනි.

ළමා පරපුරේ නැණ නුවණ වර්ධනය කිරීම සඳහා රට පුරා පාසැල් තුන්සියයක් තනා දුන් අනගාරික ධර්මපාලතුමා පරම විඥානාර්ථ සමාගම ඇසුරෙන් මෙම පාසල්වලට ආධාර උපකාර කරමින් උගත් බෞද්ධ පිරිසක් බිහි කරන්නට කැප විය. දෙස් විදෙස් ජනතාවට බෞද්ධාගමේ හරය සහ වටිනාකම පෙන්වාදීම සඳහා බෞද්ධ පොත්පත් රැසක් රචනා කළ මෙතුමා කළ කී බොහෝ දෑ නිසාවෙන් යටත් විජිතවාදී ගති ලක්‍ෂණ මෙරට ජනයා තුළින් කෙමෙන් බැහැර යන්නට විය. වැවයි, දාගැබයි, ගමයි, පන්සලයි යන සංකල්පය සමාජගත කිරීමට මූලික අඩිතාලම සකස් කළේය. යුරෝපීය ඇඳුම බැහැර කොට රෙද්ද බැනියම අඳින සමාජයක් බිහි කිරීමට ධර්මපාලතුමා කටයුතු යෙදවීය. තමන්ට කෙතරම් සැපවත් දිවියක් ගත කරන්නට වාසනාව තිබුනත් ඒ සියල්ල කැප කළේ මෙරට ජනතාවගේ ආකල්පමය සංවර්ධනයක් තුළින් ජාතිකත්වය සහ ආගමිකත්වය නගාසිටුවීමට ය. ලාංකේය ජනතාව තුළ ආගමිකත්වය හා බැඳි ආචාරශීලීත්වයක් ගොඩ නගන්නට වෙහෙසුණු අනගාරික ධර්මපාල චරිතයේ බොහෝ ගති ලක්‍ෂණ තවමත් සමාජය තුළ දැකගත හැකිය.

සිය රට ජාතිය ආගම ගොඩනැගීමටත් ආරක්‍ෂා කිරීමටත් කැපවූ අනගාරික ධර්මපාලතුමාගේ ජීවිතය තුළ ගැබ්වූ සුවිශේෂී ලක්‍ෂණයක් වූයේ අනාගත පරපුරේ ඇස් දැල්වීම සඳහා රුවන් වැකි, දේශනාවන් සහ අපේක්‍ෂාවන් ඉදිරිපත් කිරීමයි. තමන්ට සවන් නොදෙන සිංහලයින් වෙනුවෙන් දේශනා ඉදිරිපත් කරනවාට වඩා ඔවුන් වෙනුවෙන් යමක් ලියා තබා ඉන්දියාවට ගොස් භාවනානුයෝගී දිවි පෙවතක් ගත කිරීමට එතුමන් තීරණය කරන ලදි. ඔහු ලියූ සටහන් අතර එක් තැනෙක ඔහු ඒ බැව් මෙසේ සඳහන් කරනු ලබයි.

"වරද දුටු තැන එම වරද පෙන්වාදීම මාගේ ධර්මතාවය යි. එසේම මම ප්‍රේම සිතින් සිංහලයින් වෙත කරනු ලබන අවවාද පිළිගැනීමට ඔවුන් අකමැති බැවින් අවවාද කිරීමට මාගේ කාලය ගත කිරීම අප්‍රයෝජනවත් බව මාගේ හැඟීමයි. එබැවින් පසුගිය මාස තුනෙහිදී සෑම දිනකම මධ්‍යම යාමය පසුවී දෙපැයක් ගිය තැන නින්දෙන් නැගිට එතැන් පටන් සිංහල බෞද්ධයන් උදෙසා ධර්මාවවාද වාක්‍ය ලිවීමට කාලය ගත කෙළෙමි. අවවාද වචන ශ්‍රවනය කරන්නට කන් යොමු නොකරන ක්‍රෝධ සිතින් ක්‍රියා කරන මනුෂ්‍ය සමූහයා අතර නතර වීම සමාධි භාවනා කිරීමට සුදුසු නොවන්නේය. මගේ පියාණන් විසින් මට දී ඇති දායාද බුදු දහමේ චිරස්ථිතිය වෙනුවෙන් යොමු කරන්නට මාගේ සහෝදරයන් වෙත පැවරුවෙමි. සමාධි භාවනාව කිරීමට සුදුසු ස්ථානයක් ලංකාවේ සොයා ගැනීම දුෂ්කර ය. මෛත්‍රී කරුණා ඇති සත්පුරුෂයන් දෙදෙනෙකුවත් ආශ්‍රය කිරීමට නැති බැවින් සංවේගයෙන් සිටිමි.

ලබන මාසයේ පමන ලංකා භූමිය අත්හැර බුදු පසේ බුදු මහරහතුන්ට ද චක්‍රවර්තී රජදරුවන්ට ද සැප දුන් මධ්‍ය මණ්ඩලය දිශාභිමුඛව ගමන් කරන්නෙමි.”

අනගාරික ධර්මපාලතුමාගේ චරිතය පිළිබඳව මතකාවර්ජනයක යෙදෙන විට දකින්නට ලැබෙන සුවිශේෂී කාරණයක් ලෙස එතුමන් ඉදිරිපත් කළ වැකි සඳහන් කළ හැකිය. එවැනි උදාර වැකි අතරින් කිහිපයක් මෙලෙස සඳහන් කළ හැකිය.

- සිංහල ජාතිය වෙනුවෙන් දිවි පුදන්නට මම සැරසී සිටිමි.
- මගේ රට, මගේ ජාතිය, මගේ ආගම, මගේ භාෂාව කියා වටිනා රත්න හතරක් මට තියෙනවා. ඒ රත්න හතර ආරක්ෂා කරගැනීම මාගේ යුතුකමයි. මෙය සිතට ගෙන සතර අගතියෙන් වෙන් වී දිවි ගෙවිය යුතුය.
- සිංහල බෞද්ධ දරුවනි දිවි යතත් බොරුවක් නොකියන්නට අධිෂ්ඨාන කරගනිව්.
- දිවා රෑ දෙකෙහි සිංහලයන් වීරිය කළොත් වර්ෂයක් තුළ සිංහල ජාතිය දියුණු අඩියකට පමුණුවාගත හැකිය. එබැවින් සිංහලයිනි වීර්යයෙන් කටයුතු කරව්.
- සිංහලයින්ට විස මත්පැන් බොන්නට දී සිංහලයින් නැති කළ සුද්දා අපේ පරම්පරා හතුරකු ලෙස මම සළකමි.
- වරද දුටු තැන එම වරද පෙන්වාදීම මගේ ගතියයි. මගේ අවවාද පිළිගැනීමට අසතුටු නම්, ඒ බව දැන්වූ පසු මට වෙන රටකට ගොස් සිටිය හැක.
- අපේ මිනිසුන්ගේ වැඩේ කෑමයි, බීමයි, නිදාගැනීමයිනේ ඉතින් කොහොමද දියුණු වන්නේ ...?
- බුද්ධාගම ආරක්ෂා කරන්නට උපන් ජාතිය සිංහල ජාතියයි. වර්ෂ දෙදහස් පන්සියයක් බුදු දහම ආරක්ෂා කළ වෙනත් ජාතියක් නැත.
- මම මේ සියලු වීර්ය කරන්නේ සිංහල ජාතියට ද, බුද්ධාගමට ද ඇති බලවත් කරුණාව නිසයි. සිංහලයින් සාමයෙන් ක්‍රියාකොට දියුණුව කරා පැමිණීමට උත්සාහ කරව්.
- මම අපේ සිංහලයින්ට බනින්නේ මගේ සහෝදර දොස්තර හේවාවිතාරණට බනින්නාක් සේ සහෝදර ප්‍රේමයකින් යුක්තව ය. ලෝකයේ බොහෝ රටවල සංචාරය කළ මම පිටරටවල් දියුණුවෙන සැටිත්, අපේ රට පමණක් පිරිහෙන සැටිත් දැක ඉවසාගත නොහැකි වේදනාවකිනුයි බනින්නේ. තරහකින් නොවේ. ජාතික වේදනාවකිනුයි.
- අප ජාතිය නැතිවීමට මත්පැන් බීම හේතු වී තිබේ.
- මම හිරගෙදර දුක් විඳිමි. මා බේරාගන්නට කිසිවකුත් ඉදිරිපත් නොවීම නිසා දුකින් පසුවෙමි. සිංහලයාට ඒ තරමටම මා එපාවීද ?

- ප්‍රයෝජනවත් ගසක් කපා දැමීම මහත් පාඩුවක්. දැනට ලංකාවේ කොස් නැදුන් බුරුත වැනි ශාක සොයා ගැනීම දුෂ්කරයි. මේ ගස් රැකගත යුතුයි. කොස් ඇට වත්තේ තැන් තැන්වල සිටවාපන්.
- දවසට දෙවරක් පන්සිල් සමාදන් වියන්. පෝය දිනයට අටසිල් සමාදන් වියන්. එවිට උඹ සිංහල බෞද්ධයෙකු වග නිතර නිතර මතකයට නැගේවි.
- ශිල්ප කර්මාන්ත ඉගෙනගත් ජපනුන් යුරෝපය පරාජය කළහ. අපේ සිංහල තරුණ පරපුර නීතිය හා වෙදකම පමනක් උගැන්මට වීර්ය කරති. ශිල්ප කර්මාන්ත ගැන නොසිතන ජාතිය දිළිඳු වන්නේය.
- භික්ෂූන් වහන්සේලා කුසීතකම අතහැර නිතරම බෞද්ධයන්ට අනුශාසනා කරනවානම් සිංහල බෞද්ධයන් ඉක්මනින්ම අභිවෘද්ධියට පැමිණෙනවා නියතය.
- හැම පාසලකම ශිෂ්‍යයින්ට කිසියම් ශිල්පයක් ඉගැන්විය යුතුය. මැහීම්, ගෙතීම්, රෙදි විවීම්, බීරළු ගෙතීම, ගස් සිටුවීම, කෑම පිසීම, එළවළු කොරටු කිරීම ආදිය ගුරුවරුන් විසින් මහත් භක්තියකින් කළ යුතු වන්නේය.
- ඉංග්‍රීසීන් බලය වැඩිකර ගැනීමට ගත් ක්‍රියාමාර්ගය නම් පන්සල්වල ඉගැන්වීම නතර කර දැමීමයි.
- ඉංග්‍රීසිහු උඩරට පවුල්වල සියලු නිලමෙවරු වෙඩි තබා මරා දැමූහ. උඩරට ඉතිරි වූයේ දුර්වල පිරිසක් පමනකි. එතැන් පටන් උඩරට වැස්සෝ පිරිහීමට පත් වූහ.
- අවවාද කරනවිට බොහෝ තැන්වල හිත් වේදනා ඇතිවන ලෙස වචන භාවිත කරන්නේ යැයි මට චෝදනා කරනවා. මේ සම්බන්ධව අපේ ස්වාමීන්වහන්සේලා විසින් ගිහියන්ට කරුණු වටහා දිය යුතුයි.
- මෝඩ සිංහලයින්ට උම්බලකඩ නැතිව ආහාර ගැනීම අපහසුයි. ඒ සඳහා වසරක් පාසා මේ යොදවන මුදල ශිල්ප ශාස්ත්‍ර ඉගෙනීමට යොදා ගන්නවානම් කොපමන අගනේද ? සෑම ගෙදරකම පින් කැටයක් තබා උම්බලකඩ සඳහා වැය කරන මුදල ඉතිරි කළ යුතුයි.
- ඉංග්‍රීසි උගත් සිංහලයින් සිතන්නේ භික්ෂූන්ගෙන් ඉගෙන ගන්නට දෙයක් නැතැයි කියා. ඉංග්‍රීසි දත් සිංහලයින්ගෙන් ගරු බුහුමන් ලබනවාට වඩා භික්ෂූන් වහන්සේලා ඉංග්‍රීසි උගත යුතුයි.
- පාසලට යන බාල පරම්පරාවට යහපත් සිරිත් විරිත් ඉගැන්වීමට ආචාර්යවරුන් වගබලාගත යුතුය. බාල පරම්පරාව හොඳට හදා ගතහොත් සිංහල ජාතිය වර්ධනය වනු නිසැකය.
- මිනිසුන් විඳින දුක් කරදර ගැන හිතුවාම මට උහුලන්නට බැරි තරම් සිත් වේදනාවක් ඇතිවිය. දුප්පත් අයට හැකි උපකාරයක් කරන්නට මම සැදී පැහැදී සිටින්නේ ඒ නිසාවෙනි.

යනුවෙන් එතුමන් ඉදිරිපත් කළ උදාර වැකි අදටත් සමාජය තුළ දෝංකාර දෙයි. එපමණක් නොව අනගාරික ධර්මපාලතුමන් විසින් කරන ලද ප්‍රකාශයන් මෙරට ජනතාවගේ හදවත් ජාත්‍යාලයෙන් ඔද වඩවන්නට සමත්කම් දැක්වීය. එමෙන්ම පරගැති සිරිත් විරිත් මහත් අභිරුචියෙන් වැළඳගත් කළු සුද්දන්ට එම ප්‍රකාශ හදවත පසාරු කරන හී පහරවල් හා සම විය. ධර්මපාලතුමා නිරන්තරයෙන් සිංහලයාගේ වරදක් දුටු තැන එය නිර්දය ලෙස විවේචනය කළේය. එසේම අනාගත පරපුර වෙත කරුණා සිතින් අවවාද ලබා දෙන ලදි.

"දිවා ආහාරය ගෙන විවේක ගන්නා දෙමළ රික්ෂෝකාරයා මොකද කරන්නේ ? තමන් ඇදගෙන යන රික්ෂෝ එකටම හේත්තු වෙලා පුවත්පතක් හඩගා කියවනවා. උගේ ජාතියේ අන් උදවිය ඒකා වට කරගෙන ඒකට කන් දී අසා සිටිනවා. අපේ සිංහල ගොන් තක්කඩියා මොකද කරන්නේ ? එක්කෝ රා බොනවා. නැතිනම් සූදු කෙළිනවා. එහෙමත් නැතිනම් දෙදන තුරුළු කරගෙන බූරු ඇඳක බුදි."

"අත්තදීපා විහරථ අත්ත සරණා අනඤ්ඤ සරණා, ධම්මදීපා විහරථ ධම්ම සරණා අනඤ්ඤ සරණා"
(ලාභයට ඔබට රා, අරක්කු හා සොසේජ්, විස්කි දෙමින් ඔබ ලවා තමාගේ බඩු මිලදී ගන්වන විදේශිකයා විශ්වාස නොකරන්න)
නිරන්තර පරාර්ථ චර්යාවේ නියැලුණු අනගාරික ධර්මපාලතුමාගේ ප්‍රාර්ථනය වූයේ "බුදු දහම ලෝකයේ ප්‍රචාරය කිරීම සඳහා තවත් විසි පස් වතාවක් යළි ඉපදේවා","මම දුකින් මිදී අන් අයද දුකින් මුදවමි" යන්නයි.

හෙයියන්තුඩුවේ සිරි දේවමිත්ත හිමියන් අනගාරික ධර්මපාලතුමන්ට තරුණ අවධියේ දුන් අවවාදයකට අනුව 1931 ජූලි 13 වන දින බෝරුක්ගමුවේ සිරි දේවමිත්ත මහ තෙරුන් වහන්සේ ආචාර්ය තනතුරෙහි තබාගෙන සිරි දේවමිත්ත ධර්මපාල යන නමින් පැවිදි දිවියට ඇතුළු විය. සිරි දේවමිත්ත යන්න සිය පැවිදි නමට ඇතුළු කරගනු ලැබූයේ හෙයියන්තුඩුවේ හිමියන්ට කෘතගුණ සැලකීමට යි. කෝදාගොඩ උපසේන නාහිමිට ගෞරවය පළ කිරීමට උන්වහන්සේගේ පරණ සිවුරක් සිය පරිහරණයට ගෙන්වා ගන්නා ලදී. මෙරට උපන් අනගාරික ධර්මපාලතුමන් සිය ජීවිතයෙන් සමුගත්තේ බුදුන් වහන්සේ උපන් දේශය වන ඉන්දියාවේදීය. එය සිය ජීවිතය තුළ එතුමන් ලැබූ භාග්‍යයකි. 1933 වසරේ අප්‍රේල් මස 29 වැනි දින ඉන්දියාවේ සාරානාත් හිදී අනගාරික ධර්මපාලතුමන් අවසන් ගමන් ගියේ වසර 68 ක් තරම් කාලයක් ආයු වැළඳීමෙන් අනතුරුව ය. එතුමන්ගේ භෂ්මාවශේෂ වලින් කොටසක් බරණැස ඉසිපතනාරාමයේ තැන්පත් කරන ලදී. ඉතිරි කොටස ලංකාවට වැඩම කරවන ලදී. ජාතියක්, දේශයක්, ආගමක් අවදිකරවීම උදෙසා අපමන වෙහෙසක් ගත් අනගාරික ධර්මපාලතුමන් ශ්‍රී ලාංකේය සමාජය වර්තමානයේ පවා සිහි කරන්නේ ඉමහත් භක්ත්‍යාදරයෙනි.